සියලු ම හිමිකම් ඇවිරිණි.

[redacted]


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2023(2024)

25 - ශ්‍රී ලංකා ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2023 (2024)

25 - ශ්‍රී ලංකා ඉතිහාසය

ලකුණු බෙදී යාම

I පත්‍රය	01 x 40	=	40

II පත්‍රය

අනිවාර්ය පළමු ප්‍රශ්නයට ලකුණු	=	12
සෙසු ප්‍රශ්න 03 කට 16 බැගින්	=	48
II පත්‍රය අවසාන ලකුණු	=	60
අවසාන ලකුණු	=	**40+60= 100**

23334

AL/2023(2024)/25/S-I

[All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලමුද්‍රාව පිටපත් කිරීම තහනම්ය.

இலங்கைப் பரீட்சைத் திணைக்களம், Sri Lanka Department of Examinations, Sri Lanka

Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

ශ්‍රී ලංකා ඉතිහාසය இலங்கை வரலாறு History of Sri Lanka	I (I කොටස) I (பகுதி I) I (Part I)	25 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ශ්‍රී ලංකා ඉතිහාසය - ඇත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

විභාග අංකය: .....

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් දෙකකින් සමන්විත වේ.
* I කොටසෙහි 1- 40 දක්වා ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම ලබා දී ඇති උපදෙස් පරිදි පිළිතුරු සපයන්න.
* I කොටසෙහි නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු I කොටස, II කොටසේ පිළිතුරු පත්‍ර සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

* අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම තුමක් දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

1. (1) දොරවක (2) කුරුවිට (3) බඹරගල
   (4) පොහාන (5) පිදුරංගල (.....)

2. (1) මහාවංසය (2) දීපවංසය (3) ථූපවංසය
   (4) ධාතුවංසය (5) කළිඟු වංසය (.....)

3. (1) උපෝසථඝර (2) සූතිඝර (3) ප්‍රතිමාඝර
   (4) බෝධිඝර (5) ජන්තාඝර (.....)

4. (1) හතරවන උදය (2) පළමුවන වික්‍රමබාහු (3) ලීලාවතී බිසව
   (4) දෙවන විජයබාහු (5) කල්‍යාණවතී බිසව (.....)

5. (1) ගිරා සංදේශය (2) පරෙවි සංදේශය (3) තිසර සංදේශය
   (4) සැළලිහිණි සංදේශය (5) කෝකිල සංදේශය (.....)

6. (1) ජෙරොනිමෝ ද අසඑදූ (2) පේරෝ ලෝපේස් ද සූසා (3) පිලිප් ද මලිවෙරූ
   (4) කොන්ස්තන්තීනූ ද සා ද තොරෙස්සද්සා (5) දියෝගු ද මේලෝ ද කස්මත්‍රෝ (.....)

7. (1) බඩහැලු බද්ද (2) කිත්තර බද්ද (3) කුරුවේ බද්ද
   (4) මඩිගේ බද්ද (5) මරුල බද්ද (.....)

8. (1) මුල්ලේරියා සටන (2) දත්තුරේ සටන (3) කටුවන සටන
   (4) බලන සටන (5) රත්දෙණිවෙල සටන (.....)

9. (1) ජේම්ස් ටේලර් (2) ජෝර්ජ් ටර්නර් (3) එමර්සන් ටෙනන්ට්
(4) එච්.ඩබ්. කොඩ්රිංටන් (5) එච්.සී.පී. බෙල් (.....)

10. (1) කොල්බෘක්-කැමරන් (2) පීඩල් (3) කෘව්-මැකලම්
(4) ඩොනමෝර් (5) සෝල්බරි (.....)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නොගැලපේ**. එම **නොගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය, ඉදිරියේ ඇති **වරහන** තුළ ලියන්න.

11. (1) වංසත්ථප්පකාසිනි - මහාවංසයට ලියන ලද ටීකාවකි.
(2) දීපවංසය - දිවයිනේ පළමුවන වංස කතාවයි.
(3) සරජෝතිමාලෙයි - යාපන රාජධානියේ ඉතිහාසය ඇතුළත් වන ග්‍රන්ථයකි.
(4) නිකාය සංග්‍රහය - ශාසන ඉතිහාසය අඩංගු කෘතියකි.
(5) බාරස කාව්‍යය - මහනුවර යුගයේ දී ලියන ලද කාව්‍ය ග්‍රන්ථයකි. (.....)

12. (1) ධර්මපාල - දොම් ජුවාන්
(2) නිකපිටියේ බණ්ඩාර - දොම් මැතුවෙල්
(3) යමසිංහ බණ්ඩාර - දොම් ෆිල්ප්
(4) කොහප්පු බණ්ඩාර - ඔස්ට්‍රියාවේ දොම් ජුවාන්
(5) කුසුමාසන දේවී - දෝන කතරිනා (.....)

13. (1) සිල්වත් සමාගම - වැලිවිට සරණංකර හිමි
(2) පරම විඥානාර්ථ සමාගම - අනගාරික ධර්මපාල
(3) රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙන - වලානේ සිද්ධාර්ථ හිමි
(4) විද්‍යෝදය පිරිවෙන - හික්කඩුවේ සුමංගල හිමි
(5) විද්‍යාලංකාර පිරිවෙන - රත්මලානේ ධර්මාරාම හිමි (.....)

14. (1) තේ පර්යේෂණායතනය - කලවකැලේ
(2) පොල් පර්යේෂණායතනය - ලුනුවිල
(3) රබර් පර්යේෂණායතනය - අඟලවත්ත
(4) කුරුඳු පර්යේෂණායතනය - බලපිටිය
(5) දඹල පර්යේෂණායතනය - පල්ලේකැලේ (.....)

15. (1) ඒ.එෆ්. මොලමුරේ - ප්‍රථම කථානායක
(2) ඩී.එස්. සේනානායක - ප්‍රථම අගමැති
(3) එන්.එම්. පෙරේරා - ප්‍රථම විපක්ෂනායක
(4) ඩී.බී. ජයතිලක - ප්‍රථම සභානායක
(5) ජේ.ආර්. ජයවර්ධන - ප්‍රථම කෘෂිකර්ම ඇමති (.....)

- අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරවල දී ඇත. Y තීරයේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට **නොවේ**. Y තීරය, X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න.

16.

X	Y
(i) පණ්ඩුවාසුදේව	A ලීලාවතී
(ii) කාවන්තිස්ස	B සෝමා දේවී
(iii) වට්ටගාමණී අභය	C විහාරමහා දේවී
(iv) පළමුවන පරාක්‍රමබාහු	D භද්දකච්චානා
(v) නිශ්ශංකමල්ල	E කල්‍යාණවතී

(1) DABCE (2) DBCAE (3) DCABE (4) DCBAE (5) DCEAB (.....)

17.

X	Y
(i) ඇලහැර අමුණ	A කළු ගඟ
(ii) මිණිපේ අමුණ	B අබන් ගඟ
(iii) හත්තොට අමුණ	C දැදුරු ඔය
(iv) වැන්කැටි අමුණ	D මහවැලි ගඟ
(v) කොටියබද්ධ අමුණ	E වලවේ ගඟ

(1) BADCE (2) BCADE (3) BDACE (4) BDAEC (5) BECDA (.....)

18.

X	Y
(i) සූරතිස්ස	A සේන හා ගුත්තික
(ii) වංකනාසික තිස්ස	B ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
(iii) පළමුවන සේන	C මාස
(iv) පරාක්‍රම පාණ්ඩ්‍ය	D චන්ද්‍රබානු
(v) දෙවන පරාක්‍රමබාහු	E කරිකාල චෝළ

(1) AEBCD (2) AECBD (3) ACBDE (4) ADBCE (5) DEABC (.....)

19.

X	Y
(i) හෙන්රි ස්ටීඩ්	A කලා වැව
(ii) විලියම් ග්‍රෙගරි	B තිස්සමහාරාම වැව
(iii) ආතර් ගෝර්ඩන්	C නාච්චදූව වැව
(iv) හර්කියුලිස් රොබින්සන්	D ඉරක්කාමම් වැව
(v) වෙස්ට් රිජ්වේ	E කත්තලේ වැව

(1) DABCE (2) DBCAE (3) DCABE (4) DCEAB (5) DEABC (.....)

20.

X	Y
(i) උඩරට රාජ්‍යයේ පළමුවන පාලකයා	A ෆ්‍රෙඩ්රික් නෝර්ත්
(ii) පළමුවන ලන්දේසි ආණ්ඩුකාරවරයා	B සේනාසම්මත වික්‍රමබාහු
(iii) පළමුවන බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා	C විලියම් ගොපල්ලව
(iv) පළමුවන අග්‍රාණ්ඩුකාරවරයා	D හෙන්රි මත්ක් මේසන් මුවර්
(v) පළමුවන ජනාධිපතිවරයා	E විලෙම් ජේ. කෝස්ටර්

(1) BADCE (2) BDECA (3) BEADC (4) BACDE (5) BCADE (.....)

- අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය කෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

21. රෝහණ රාජධානිය

(1) මහානාග රජු මාගම සිට රෝහණය පාලනය කළේ ය.
(2) මහානාග රජුගෙන් පසුව යටාලතිස්ස රෝහණයේ පාලකයා විය.
(3) කතරගම සිටි දසබෑයන් ගෝඨාභය විසින් මරා දමන ලදී.
(4) කැලණිතිස්ස රජු රෝහණ රාජධානියේ සිටි බලවත්ම පාලකයා විය.
(5) කාවන්තිස්ස රජු සේරු හා සෙම්බ රාජධානි රෝහණයට ඇඳා ගත්තේ ය. (.....)

22. සීගිරිය

(1) සීගිරිය පළමුවන කාශ්‍යප රජුගේ පාලන මධ්‍යස්ථානය විය.
(2) ආලකමන්දාවේ සිටි කුමාරියා මෙන් කාශ්‍යප රජු සීගිරියේ වාසය කළ බව කියනු ලැබේ.
(3) සීගිරි චිත්‍රවලින් දිව්‍යාප්සරාවන් පිරිසක් නිරූපණය වන බව ආනන්ද කුමාරස්වාමිගේ මතයයි.
(4) පළමුවන මොග්ගල්ලාන සිය පාලන මධ්‍යස්ථානය සීගිරියේ සිට අනුරාධපුරයට මාරු කළේ ය.
(5) සීගිරියේ කුරුටු ගී ලිවීම ආරම්භ කොට තිබෙන්නේ ක්‍රි.ව. දහවන සියවසින් පසුව ය. (.....)

23. කුරුණෑගල රාජධානි සමය

(1) දඹදෙණියේ සිට පාලන මධ්‍යස්ථානය කුරුණෑගලට රැගෙන විත් තිබේ.
(2) දෙවන බුවනෙකබාහු රජු කුරුණෑගල සිය අගනුවර බවට පත් කර ගත්තේ ය.
(3) කුරුණෑගල රාජධානියෙහි සිටි බලවත්ම පාලකයා හතරවන පරාක්‍රමබාහු රජු ලෙස සැලකේ.
(4) හතරවන පරාක්‍රමබාහු රජුගේ පාලන සමයේ අග භාගයෙහි ඇති වී තිබෙන දේශපාලන අවුල් වියවුල් පිළිබඳව මැදවල නම් සන්නසේ සඳහන් වේ.
(5) ජාතක කථා පොත කුරුණෑගල සමයේ දී සිංහල බසට පරිවර්තනය කරන ලදැයි සලකනු ලැබේ. (.....)

24. 1815 උඩරට ගිවිසුම

(1) ඕතාන්ත ආණ්ඩුකාරවරයා සහ උඩරට ප්‍රධානීන් අතර අත්සන් කරනා ලද ගිවිසුමයි.
✓(2) උඩරට පළාත්වල ආණ්ඩුකාරවරයා ලෙස ජෝන් චෙපිලි පත් කරන ලදි.
(3) නායක්කර් පෙළපතට උඩරට රජකම් සඳහා පැවති අයිතිවාසිකම් අහෝසි කරන ලදි.
(4) උඩරට ප්‍රධානීහු සිංහල සහ දෙමළ (තෙළිඟු) භාෂා දෙපෙත්හි අත්සන් කළහ.
(5) බුදුදහම ආරක්ෂා කරන බවට ඉංග්‍රීසිහු මෙම ගිවිසුමෙන් පොරොන්දු වූහ. (.....)

25. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(1) විධායක ජනාධිපති ධුරය
(2) සමානුපාතික නියෝජන ක්‍රමය
✓(3) දිවිමණ්ඩල ව්‍යවස්ථාදායකය
(4) ජනමත විචාරණය
(5) දෙවාභිමයෝගය .(.....)

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ..... 1 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ..... 2 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ..... 3 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ..... 4 ද,
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ..... 5 ද, වරහන තුළ ලියන්න.

උපදෙස් සම්පිණ්ඩනය				
1	2	3	4	5
(A) සහ (B) පමණක් නිවැරදි ය.	(A) සහ (C) පමණක් නිවැරදි ය.	(B) සහ (C) පමණක් නිවැරදි ය.	(C) සහ (D) පමණක් නිවැරදි ය.	වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි ය.

26. පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) බුරුමය ආක්‍රමණය කිරීම
(B) කාම්බෝජය සමඟ මිත්‍ර සබඳතා පැවැත්වීම
(C) චෝළයින් සමඟ විවාහ සබඳතා පැවැත්වීම
(D) තායිලන්තයෙන් ශ්‍රී ලංකාවට උපසම්පදාව රැගෙන ඒම (.....)

27. යාපන රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ගෙගරාශෙඛරමාලෙයි ග්‍රන්ථය යාපන රාජධානිය පිළිබඳ ප්‍රධාන මූලාශ්‍රයකි.
(B) මාඝ ආක්‍රමණය යාපන රාජධානිය බිඳවීමට ප්‍රධාන හේතුවක් විය.
(C) ගම්පොළ රාජධානියට යාපන රාජධානියෙන් බලවත් තර්ජනයක් තිබුණි.
(D) යාපනයේ පාලකයා ලංකාවේ සුල්තාන්වරයා යැයි ඉබන් බතූතා සඳහන් කරයි. (.....)

[පසුවනි පිටුව බලන්න.

28. පෘතුගීසි ආගමික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) පෘතුගීසිහු කතෝලික ආගම ප්‍රචාරය කළහ.
(B) හත්වන බුවනෙකබාහු කතෝලික ආගමට හැරවීමට පෘතුගීසිහු සමත් වූහ.
(C) ෆ්‍රැන්සිස්කන් හා ජෙසුයිට් පූජකයෝ පෘතුගීසි ආගමික කටයුතුවල මූලිකත්වය ගත්හ.
(D) ෆර්නාවෝ ද ක්වේරෝස් පියතුමා ආගම ප්‍රචාරය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණියේ ය. (2 .....)

29. ආරුමුග නාවලර් සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) ආරුමුග නාවලර්, අනගාරික ධර්මපාල සමඟ සමීප සබඳතාවක් පැවත්වී ය.
(B) ආරුමුග නාවලර් අම්දාපප ව්‍යාපාරයේ ප්‍රබල ක්‍රියාකාරිකයෙකි.
(C) ආරුමුග නාවලර් දහනවවන සියවසේ දෙවන භාගයේ ඇති වූ හින්දු පුනරුදයේ පුරෝගාමියා විය.
(D) ආරුමුග නාවලර් යාපිවත්ගල විද්‍යාසාලෙයි පිහිටුවී ය. (...4....)

30. 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?
(A) හප්පි මරික්කාර්, මුහන්දිරම් තනතුරෙන්ට පත් කිරීම කෝලාහලයට ප්‍රධාන හේතුව විය.
(B) ගම්පොළ වල්ලභගොඩ දේවාල පෙරහැරේ දී ඇති වූ ගැටුමක ප්‍රතිඵලයක් ලෙස මෙම කෝලාහලය ආරම්භ විය.
(C) කෝලාහලය මැඩපැවැත්වීම සඳහා යුද නීතිය පනවනු ලැබී ය.
(D) ජී.සී. ලෝරි මෙම නඩුවේ විනිශ්චයකාරවරයා විය. (3 .....)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. කන්තලේ වැව ඉදිකරවන ලද්දේ කවරෙකු විසින් ද?
(1) දෙවන අග්ගබෝධි රජු
(2) දෙවන ජෙට්ඨතිස්ස රජු
(3) දෙවන උපතිස්ස රජු
(4) දෙවන සේන රජු
(5) දෙවන මොග්ගල්ලාන රජු (1 .....)

32. දඹදෙණි රාජධානියේ පළමුවන පාලකයා කවුරුන් ද?
(1) දෙවන විජයබාහු රජු (2) දෙවන පරාක්‍රමබාහු රජු (3) තුන්වන විජයබාහු රජු
(4) තුන්වන පරාක්‍රමබාහු රජු (5) පළමුවන බුවනෙකබාහු රජු (.....)

33. ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම විසින් 1762 දී උඩරට රාජධානිය වෙත එවන ලද දූතයා කවුරුන් ද?
(1) හියු බොයිඩ් (2) ජෝන් පයිබස් (3) රොබට් ඇන්ඩෘස්
(4) මැක්ඩොවල් (5) ජෝන් ඩේවි (.....)

34. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ කවර බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයාගේ පාලන කාලයේ දී ද?
(1) හෙන්රි වෝඩ් (2) විලියම් ග්‍රෙගරි (3) ආතර් ගෝර්ඩන්
(4) වෙස්ට් රිජ්වේ (5) හෙන්රි මැකලම් (5 .....)

35. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම මන්ත්‍රීවරිය කවුරුන් ද?
(1) ඩොරින් වික්‍රමසිංහ (2) ඇඩිලින් මොලමුරේ (3) මේරි රත්නම්
(4) කුසුමා ගුණවර්ධන (5) වීවියන් ගුණවර්ධන (2 .....)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ **අංකය චරහන තුළ** ලියන්න.

	පළමුවන ප්‍රකාශය	දෙවන ප්‍රකාශය
1	නිවැරදි ය.	වැරදි ය.
2	නිවැරදි ය.	නිවැරදි ය.
3	වැරදි ය.	වැරදි ය.
4	වැරදි ය.	නිවැරදි ය.
5	නිවැරදි ය.	නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි.

	පළමුවන ප්‍රකාශය	දෙවන ප්‍රකාශය	
36.	සිරිමේඝවණ්ණ රජු දවස දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කරවන ලදී.	බුදුල්ල වැම් ලිපියෙහි හෝපිටිගම තිබූ වෙළෙඳ මධ්‍යස්ථානයක් පිළිබඳව සඳහන් කර තිබේ.	(...2...)
37.	පළමුවන පරාක්‍රමබාහු රජතුමා විසින් කරන ලද සංඝ සාමග්‍රිය පිළිබඳව ගල් විහාර සෙල්ලිපියේ විස්තර කොට තිබේ.	දෙවන පරාක්‍රමබාහු රජු පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ මුණුපුරෙකි.	(...1...)
38.	පෘතුගීසීන් විසින් උඩරට රාජ්‍යයට එරෙහිව කරන ලද අවසන් යුද්ධය ගත්නෝරුව සටනයි.	දෙවන රාජසිංහ රජුගේ ප්‍රධාන බලාපොරොත්තුව වූයේ පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමයි.	(...2...)
39.	පෘතුගීසීන් විසින් ලංකාවට මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දෙන ලදී.	මුද්‍රණ යන්ත්‍රයෙහි ආධාරයෙන් පෘතුගීසිහු සිය ආගම ප්‍රචාරය කිරීමට කටයුතු කළහ.	(...3...)
40.	1958 වර්ෂයේ දී කුඹුරු පනත පනවන ලදී.	1978 වර්ෂයේ දී වතු ජනසතු කිරීම ආරම්භ කෙරිණි.	(...4...)

**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023(2024)

විෂය අංකය
பாட இலக்கம் 25

විෂයය
பாடம் ශ්‍රී ලංකා ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

I පත්‍රය/பத்திரம் I

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	3	11.	3	21.	4	31.	1
02.	5	12.	2	22.	5	32.	3
03.	2	13.	2	23.	1	33.	2
04.	1	14.	4	24.	2	34.	5
05.	3	15.	5	25.	3	35.	2
06.	3	16.	4	26.	1	36.	2
07.	5	17.	4	27.	5	37.	1
08.	3	18.	1	28.	2	38.	2
09.	1	19.	5	29.	4	39.	3
10.	2	20.	3	30.	3	40.	1

ශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வ

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 =

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2023 (2024)

ඉතිහාසය I (II කොටස)

ඉතිහාසය ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:

- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- II කොටස A, B හා C ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- A කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස සමග සපයා ඇත.)

A කොටස

(1) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

(i) සේරුවිල	(ii) මහියංගනය	(iii) මාතොට	(iv) මුලතිව්
(v) පුත්තලම	(vi) කළුතර	(vii) හුරුළු වැව	(viii) ඌරාතොට
(xi) කැලණි ගඟ	(x) මල්වතු ඔය	(xi) මධ්‍යම පළාත	(xii) නාච්චදූව වැව

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගින්)

B කොටස

2. 1815 දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික වර්ධනය කෙරෙහි අභ්‍යන්තර භූගෝලීය සාධක බලපා ඇති ආකාරය පහත දැක්වෙන තේමා යටතේ පරීක්ෂා කරන්න

(i) ගංගා සහ ගංගා නිම්න
(ii) මධ්‍යම කඳුකරය
(iii) වරායයන්

(i) ගංගා සහ ගංගා නිම්න

- මධ්‍ය කඳුකරයේ සිට දිවයිනේ සෑම දිශාවකටම ගලා බසින ගංගා පද්ධතියක් හා පළල් නිම් සහිත ගංගාද්‍රෝණි තිබීම.

- මුල් ජනාවාස පිහිටුවීමට හා ඒවායේ ව්‍යාප්තියට බලපෑම (ගංගා ඔස්සේ රට අභ්‍යන්තරා ජනාවාස ව්‍යාප්ත වීම).
නිදසුන්: මල්වතු ඔය - අනුරාධගාම / තම්බපණ්ණි නගරය

කලා ඔය - උරුවේලගාම / විජිතගාම
කණදරා ඔය - උපතිස්සගාම
ගල් ඔය - දීඝගාම.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

ශ්‍රී ලංකා ඉතිහාසය I இலங்கை வரலாறு I History of Sri Lanka I	25	S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 1

විභාග අංකය / சுட்டெண் / Index No. .....



- අතීත රාජධානි ගංගාශ්‍රිතව බිහිවීම:
  නිදසුන්: මල්වතු ඔය - අනුරාධපුරය; මහවැලි ගඟ - පොළොන්නරුව.

- දේශසීමා වෙන් කිරීම සඳහා ගංගා යොදා ගැනීම:
  නිදසුන්: රජරට - ~~කලා ඔය~~ හා ~~මල්වතු ඔය~~
  රුහුණු රට - මහවැලි ගඟ, කළු/බෙන්තර ගංගා
  දොළොස්දහස් රට - වලවේ ගඟ හා බෙන්තර ගඟ
  අටදහස් රට - වලවේ ගඟ හා මහවැලි ගඟ.

- අනුරාධපුර හා රුහුණු රට පාලකයන්ගේ ආරක්ෂක කටයුතුවලට ගංගා ඉවහල්වීම:
  නිදසුන්: කාවන්තිස්ස රජු මහවැලි ගඟේ තොටමුණු සියල්ල රැකවල්ලෑම; I පරාක්‍රමබාහු රජු, විල්ගම්තොට සිට ත්‍රිකුණාමලය දක්වා සෑම තොටමුණක්ම රැකවල්ලෑම.

- මුල සිටම ජනාවාස ගංගා නිම්නවල බිහිවීම හා කෘෂි ආර්ථිකය හා ඒ හා බැඳුණු සමාජ-සංස්කෘතියක් වර්ධනයට හේතු වීම:
  නිදසුන්: උතුරු තැන්න - ~~කලා ඔය~~, ~~මල්වතු ඔය~~
  නැගෙනහිර තැන්න - ~~වලවේ ගඟ~~, ~~කිඹිදි ඔය~~

- වාරිකර්මාන්ත නිර්මාණයට/වර්ධනයට ගංගා ඉවහල්වීම:
  නිදසුන්: කලා ඔය - කලා වැව
  මහවැලි ගඟ - මිණිපේ අමුණ.

- ප්‍රවාහනය හා ගමනාගමනය සඳහා ගංගා භාවිත කිරීම; ගංගා ආශ්‍රිතව මාර්ග බිහිවීම (නිදසුන්: මාගම සිට රජරට තෙක් වූ මහවැලි ගඟ ඔස්සේ පැවති මාර්ගය).

- ගංගා මුවදොරවල හා තොටුපළවල වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවනු ලැබීම (නිදසුන්: මහාතිත්ථ, ගෝකණ්ණ හා ගොඩවාය වරායයන්).

- උඩරට රාජධානියේ ආරක්ෂාවට මහවැලි ගඟ උපයෝගී වීම.

(ii) **මධ්‍යම කඳුකරය**

- ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැඩගැස්වීමෙහිලා දිවයින මධ්‍යයේ, ප්‍රවේශවීමට දුෂ්කර කඳුකර ප්‍රදේශයක් පිහිටීම තීරණාත්මක ලෙස බලපා තිබීම.

- කන්දඋඩ පස්රට උස් සානුවක පිහිටා තිබීම.

- එය ගිරිදුර්ග, ජලදුර්ග, වනදුර්ග ආදිය හේතු කොට ගෙන විදේශ ආක්‍රමණ හා සිවිල් අරගල අවස්ථාවලදී ආරක්ෂිත ස්ථානයක් බවට පත්වීම.

- රජවරුන් විදේශීය ආක්‍රමණ හමුවේ මෙම කලාපය අභය ස්ථානයක් වශයෙන් තෝරා ගැනීම.
  නිදසුන්: දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ වට්ටගාමිණී අභය, I සේන හා I විජයබාහු වැනි පාලකයන්

- රාජ උදහසට ලක් වූ පුද්ගලයන් ආරක්ෂාව පතා මෙම ප්‍රදේශයට පළා යාම.
  නිදසුන්: කාවන්තිස්ස රජුගේ උදහසට ලක් වූ දුටුගැමුණු කුමරු; II සංඝතිස්ස රජුගේ පුත් ජෙට්ඨතිස්ස කුමරු; II මහින්ද රජුට විරුද්ධ වූ ආදිපාද දප්පුල; II සේන රජුගේ උදහසට ලක් වූ මහාදිපාද මහින්ද.

- මෙම කලාපය කේන්ද්‍රකොට ගෙන ක්‍රමයෙන් වෙනම දේශපාලන ඒකකයක් නිර්මාණය වීම හා රාජධානි බිහිවීම (ගම්පොළ, මහනුවර).
- මෙම ප්‍රදේශයේ පිහිටීම හා ස්වභාවික බාධක හේතු කොට ගෙන විදේශ ආක්‍රමණිකයන්ට - විශේෂයෙන්ම පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට (1803දී ඉංග්‍රීසීන්ට) - උඩරට රාජධානිය යටත් කරගත නොහැකි වීම.
- ලංකාවේ ගංගා පද්ධතිය ආරම්භ වන කලාපය වීම.
- මෙරට සමාජ, ආර්ථික හා සංස්කෘතික ඉතිහාසයේ කැපී පෙනෙන වෙනස්වීම් සඳහා හේතු වූ බ්‍රිතාන්‍යයන් යටතේ වතු වැවිලි ආර්ථිකය ආරම්භ වූ කලාපය වීම.

(iii) වරායයන්

- දිවයින වටා වරායයන් පිහිටා තිබීම.
  දඹකොළ පටුන, මහාතිත්ථ, ගෝකණ්ණ, ගොඩවාය, උරාතොට, දේවනගර, ලංකා පටුන ආදිය පුරාතන යුගයේදී වඩාත් වැදගත්වීම.
  කොළඹ, ගාල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය, කල්පිටිය, මීගමුව ආදිය විශේෂයෙන්ම බටහිර යටත්විජිතවාදීන්ගේ අවධානය දිනාගැනීම.
- මුල් ජානපදිකයන්ගේ සංක්‍රමණ වරායන් ඔස්සේ සිදුවීම:
  - ✓ මහාතිත්ථ - විජය ඇතුළු 700 ක පිරිස
  - ✓ ගෝකණ්ණ - භද්දකච්චානා ඇතුළු පිරිස / ඇගේ සහෝදරයන්
  - ✓ දඹකොළ පටුන - සංඝමිත්තා තෙරණිය
- දකුණු ඉන්දියානු ආක්‍රමණ:
  නිදසුන්: මහාතිත්ථ වරාය ඔස්සේ චෝළ / මාඝ ආදී ආක්‍රමණිකයන්.
- පුරාතන වෙළඳ මධ්‍යස්ථාන වරාය+බදව පිහිටීම:
  නිදසුන්: උරාතොට, මහාතිත්ථ, ගොඩවාය
  මේවා ඔස්සේ විදේශ වෙළඳාම - ඉන්දියාව, බුරුමය, චීනය, අරාබිය, ඊජිප්තුව, රෝමය, ග්‍රීසිය ආදී රටවල් සමග
- I මුගලන් / I විජයබාහු වැනි රජවරුන් වරායයන් ඔස්සේ යුද්ධ ආධාර ලබාගැනීම.
- කොළඹ, මීගමුව, කල්පිටිය ආදී වරායයන් ඔස්සේ මධ්‍යකාලීන යුගයේ සිට වෙළඳාම වර්ධනය වීම. බේරුවල, ගාල්ල ආදී වරායයන් කේන්ද්‍ර කොට ගෙන වෙළඳ නගර වර්ධනය වීම.
- ත්‍රිකුණාමල වරාය, නූතන යුගයේදී ලංකාව කෙරෙහි බටහිර යුරෝපා ජාතීන්ගේ අවධානය යොමුවීමට විශේෂ හේතුවක් වීම (විශේෂයෙන්ම ඉංග්‍රීසීන්ගේ අවධානය).

(ලකුණු 16 යි

3. "වාරිමාර්ග ක්‍රමය පුරාතන ශ්‍රී ලාංකේය ආර්ථිකයේ ජීවනාලිය විය."

(i) අනුරාධපුරයේ ඉදිකරන ලද පළමුවන වැව කුමක් ද?

අභය වැව / බසවක්කුලම / [illegible] වැව / [illegible] වාවි

(ලකුණු 01 යි

(ii) කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය රැගෙන යාමට ඉදිකරන ලද ඇළ මාර්ගය නම් කරන්න.

යෝධ ඇළ / ජය ගඟ

(ලකුණු 01 යි)

(iii) වැවක ප්‍රධාන අංග විස්තර කරන්න.

වැව් බැම්ම - බොහෝවිට ස්වභාවික කඳු ගැට දෙකක් යා කර ඉදිකොට ඇත. මෙමගින් විශාල ජල ධාරිතාවක් රඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

රළපනාව - වැව් බැම්ම ඇතුළත බෑවුමේ ගල් අතුරා තනා ඇත. වැව් බැම්ම බාදනයවීම වැළැක්වීම මෙමගින් අපේක්ෂා කෙරේ.

සොරොව්ව - මඩ සොරොව්ව (රොන් මඩ ඉවත් කිරීම/ ජල මට්ටම අඩු අවස්ථාවල්දී වගා කටයුතු සඳහා ජලය මුදා හැරීම) සහ ගොඩ සොරොව්ව (ජලය පිටතට මුදාහැරීම) යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.

බිසෝකොටුව - සොරොව්වෙහිම කොටසකි. වැව් ඉවුර හා ජල මට්ටම සම වන තැන හතරැස් හැඩයට ඉදිකරන ලද ගැඹුරු ළිඳක් වැනි කොටසකි. විවිධ ජල මට්ටම් පවතින අවස්ථාවලදී, ජලය මුදාහරින විට අවම පීඩනයක් යටතේ එය සිදු කිරීම මගින් වැව් බැම්මට හානි වීම වළක්වා ගැනීම මෙහි කාර්යයයි.

වාන - වැවෙහි අතිරික්ත ජලය පිට කරන ස්ථානය

(ලකුණු 05 යි)

(iv) අනුරාධපුර යුගයේ අවසානය දක්වා වාරි කර්මාන්තයේ අනුක්‍රමික වර්ධනය ගෙනහැර දක්වන්න.

- රජරට ප්‍රදේශයේ වැව් ඉදිකිරීමට බලපෑ දේශගුණික හා භූගෝලීයමය සාධක. මුල්ම ජනාවාස වියළි කලාපයෙහි පිහිටුවා ගත් අතර ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වී ගොවිතැන පදනම් කරගත් කෘෂිකර්මාන්ත වීම. වී වගාවට අඛණ්ඩ ජල සැපයුමක් අවශ්‍ය වන නමුත් වියළි කලාපයේ පිහිටි ගංඟා, ඇළදොළවලින් ප්‍රමාණවත් ජල ධාරිතාවක් වර්ෂය මුළුල්ලේම නොලැබුණු බැවින් මුල් අවධියේදී සිටම අහස් ජලය එක්රැස් කර ගැනීමට වාරි කර්මාන්ත කෙරෙහි යොමුවීම.

- මුලින්ම ගම්වැව් සෑදීම සහ වසහ රජුගෙන් පසුව රාජ්‍ය මැදිහත්වීමෙන් විශාල වැව් තැනීම ආරම්භවීම

- විවිධ දිශාවලට ගලාගිය ගංගාවල ජලය එක්රැස් කොට අවශ්‍ය ප්‍රදේශයට ඒවා රැගෙන යාම; ගංගා හරස් කොට වේලි බැඳ සංකීර්ණ වාරි පද්ධතියක් සකස් කොට ඇළ මාර්ග මගින් ඒවා එකිනෙකට සම්බන්ධ කිරීම (මේවායින් ඇතැම් ඇළමාර්ගවල බෑවුම් සැතපුමකට අඟල් හයක්වීම).

- මෙම ජලාපනයන මාර්ගවල කලින් කලට වර්ධනයක් සිදුවීම. වැඩිවන ජනගහණයේ අවශ්‍යතාවනට සරිලන සේ ගංගා-ඇළ-දොළ හරස් කොට අමුණු බැඳ, ගම් වැව්, කුඩා වැව් සහ මහා වැව් වශයෙන් වාරි කර්මාන්තයේ වර්ධනයෙහි ප්‍රධාන අවස්ථා දක්නට ලැබීම.

- මුල්ම වාරිකටයුතු ක්‍රි.පූ. හතරවන සියවසේදී පණ්ඩුකාභය රජු අභය හෙවත් බසවක්කුලම වැව ඉදිකිරීමෙන් ඇරඹේ.

- ක්‍රි.පූ. තුන්වන සියවසේදී දේවානම්පිය තිස්ස රජු විසින් තිසා වැව ඉදි කරවීම සහ පසු කලෙක නගරයේ ජල අවශ්‍යතා සඳහා නුවර වැව ඉදිකරවීම.

- මීන්විල සෙල්ලිපිය හා මහාවංසය අනුව ක්‍රි.පූ. පළමුවන සියවසේදී කුටකණ්ණ තිස්ස රජු විසින් සාදවන ලද වන්නක ඇළ රාජ්‍ය අනුග්‍රහයෙන් ඉදිකළ පළමුවැනි මධ්‍ය පරිමාණයේ ඇළ වීම.

- ක්‍රි.ව. පළමුවන සියවසේදී රජ කළ වසභ රජු විශාල පරිමාණයේ වැව් සෑදීම ආරම්භ කළේය. වංසකථාවලට අනුව ඔහු වැව් එකොළහක්ද, ඇළවල් දොළහක්ද සෑදූ අතර අඹන් ගඟ හරහා සැතපුම් තිහක් බටහිරට ජලය රැගෙන ගිය ඇළහැර (යෝධ) ඇළ ඒ අතුරින් ඉතා වැදගත් වීම.
- ක්‍රි.ව. තුන්වන සියවසේ සිටි මහසෙන් රජු වැව් දහසයක් හා ඇළක් සාදවන ලද අතර ඇළහැර ඇළෙන් පෝෂණය ලැබූ මින්නේරි වැව ඒ අතුරින් ඉතා වැදගත් වේ; කවුඩුළු ඔය හරස්කොට කවුඩුළු වැව සාදන ලද අතර සැතපුම් හයක් දිග ඇළක් මඟින් එය මින්නේරි වැවට සම්බන්ධ කොට තිබේ; පබ්බතාන්න ඇළ, කණදියදොර වැව, නිරමුල්ල හා මාගල්ල වැව් ආදී බොහෝ වාරි කර්මාන්ත කරවූ මහසෙන් රජු 'මහසෙන් දෙවියෝ' නමින් හැඳින්වීම.
- ක්‍රි.ව. සතරවන සියවසේදී පළමුවන උපතිස්ස රජු තෝපා වැව ඇතුළු වැව් 6 ක් ඉදිකරවීම.
- ක්‍රි.ව. පස්වන සියවසේදී සිටි ධාතුසේන රජු වැව් දහඅටක් සෑදූ බව කියැවේ. මීට පෙර පැවති වැව් දෙකක් එකතු කොට ඉදිකළ කලා වැව ඉතා වැදගත් වූවකි; සැතපුම් පනස්හතරක් දිග ඇළක් වූ ජයගඟෙන් කලා වැවේ සිට තිසා වැවට ජලය සපයා තිබේ; මල්වතු ඔයේ ජලය සැතපුම් දාහතක් දුරට රැගෙන ගොස් මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි යෝධ වැව ඉදි කරවීම මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි පනම්කුලම හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි මැද්දෙකැටිය හ මාඵළිය යන වැව්ද මෙකල ඉදිකළ බව පිළිගැනේ.
- දෙවන මොග්ගල්ලාන රජු පත්පහණ වැව (නාච්චදූව), පදවිය, ගිරිතර නම් වැව් ඉදිකරවීම.
- පළමුවන අග්බෝ රජු [redacted]දරා, කුරුන්දි හා හිරිවඩුන්න වැව් ඉදිකරවීම.
- දෙවන අග්බෝ රජු වලහස්ස, ගිරිතලේ, ගංතලා යන වැව් තුන හා හත්තොට අමුණ ඉදිකරවී
- මෙකල මෙවැනි වැව් 35 ක් පමණ ඉදිකළ බව සඳහන් වීම හා 'දොළොස්මහ වැතැන' නම් සංකල්පයක් තිබීම.
- කෘතිම ඇළ මාර්ග පද්ධතිය මඟින් වාරි කර්මාන්ත එකිනෙකට සම්බන්ධ කිරීම (ඇළහැර අ යෝධ ඇළ හෙවත් ජයගඟ).
- මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල හා කන්තලේ යන වැව් මහවැලි ගඟ හා එහි අතු ග අසුරෙන් ඉදිකර තිබීම හා පබ්බතන්න ඇළ, තලවතු ඇළ, මිණිපේ ඇළ හා හත්තොට අ වැනි ප්‍රධාන ඇළ මාර්ග මහවැලි ගඟ ආශ්‍රිතවම නිමවා තිබීම.
- ගංගා හරස්කොට අමුණු බැඳීම (ඇළහැර අමුණ, මිණිපේ අමුණ, මහගල්කඩවල අමුණ).
- ක්‍රි.ව. 3-6 සියවස් අතර අවධිය මෙරට වාරිමාර්ග ඉතිහාසයේ පළමු ස්වර්ණමය යුගය වශ සැලකිය හැකිවීම.
- මීට පසුව ක්‍රි.ව. හයවන සියවසේදී සිටි දෙවන මුගලන් රජු විසින් සාදවන ලද නාච්චදූව, මාමඩුව යන වැව්ද ක්‍රි.ව. හයවන සියවසේදීම සිටි පළමුවන අග්බෝ රජු සාදවන ලද තන්නිමුරුප්පුකුලම් වැවද, ක්‍රි.ව. හත්වන සියවසේදී සිටි දෙවන අග්බෝ රජු සෑදූ කන්තලේ හා ගිරිතලේ වැව්ද නිසා රජරට ප්‍රදේශය වඩාත් සංවර්ධනය වීම.

(ලකුණු

4. පළමුවන විජයබාහු රජුගේ කාර්ය සාඵල්‍යය පහත දැක්වෙන මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

(i) රෝහණ දේශයේ පාලකයා බවට පත්වීම

(ii) දිවයින එක්සේසත් කිරීම

- අනුරාධපුර චෝළයන් අතට පත්වීමත් සමග ~~සිංහල~~ කුමරු රැගෙන රාජකීයයන් රෝහණ දේශයට පලා යාම - බුදල්නාග නම් දණ්ඩනායකයාගේ ආරක්ෂාව ලැබීම.
- බලයට පත්වීමේදී විවිධ දුෂ්කරතා හා අභියෝගවලට මුහුණ දීම (මූලාශ්‍ර: පනාකඩුව තඹ සන්නස)

- **රෝහණයේ බලය තහවුරු කරගැනීම.**
  පළමුවන වික්‍රමබාහු රෝහණයේ බලයට පත්වීම හා ඔහුගේ ඇවෑමෙන් එහි දේශපාලන වියවුල් හටගැනීම. බුදල්නාවන්ගේ සහාය ඇතිව කේශධාතු කාශ්‍යප හා ලෝකේශ්වර ආදී රුහුණේ පාලකයන් ජයගැනීම.

- **දිවයින එක්සේසත් කිරීම**
  කිත්ති, මහාලාන කිත්ති, ලෝකේශ්වර, කේශධාතු කාශ්‍යප වැනි දේශීය කුමාරවරුන්; වික්‍රම පාණ්ඩ්‍ය, ජගතිපාල, පරාක්‍රම පාණ්ඩ්‍ය ආදී විදේශීය කුමාරවරුන් චෝළ පාලනය බිඳදැමීමට ගත් උත්සාහයන් අසාර්ථක වීම.

  - චෝළ බලයට එරෙහිව උපක්‍රමශීලීව හා සංවිධානාත්මකව සටන් ව්‍යාපාරය මෙහෙය වීම මගින් විශාල අධිරාජ්‍යයකට එරෙහිව කළ සටන ජයග්‍රහණය කිරීම.
  - අයබදු නොගෙවා කැරලි ගැසූ රජරට වැසියන් මර්දනයට පැමිණි චෝළ හමුදාව රුහුණ ආක්‍රමණය කිරීම - රජු පලුටියගිරි (පළටුපාන) සටනේදී ඔවුන් පරාජය කිරීම. විරරාජේන්ද්‍ර පරාජයට පත්ව වාකිරිගලට පසු බැසීම.
  - කේශධාතු කාශ්‍යපගේ සොහොයුරෙකු ගුත්තහාලයේ ඇති කරන ලද කැරැල්ල මැඩ, මහනාගහුල සිට හමුදා කර කිරීම.
  - විරරාජේන්ද්‍රගේ මරණයත් සමඟ චෝළ දේශයේ අර්බුද හටගත් අතර රජු මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම - පොළොන්නරුවේ සිටි චෝළ හමුදාවට තුන් පැත්තකින් පහරදී පරාජය කිරීම, එනම්:
    - ✓ මහනාගහුල, වාකිරිගල, අනුරාධපුරය, මහතිත්ථ - බටහිර දෙසින්
    - ✓ මහානාගහුල, මාගම, බුත්තල, මහියංගනය - පොළොන්නරුව (දුටුගැමුණු ගේ ගමන් මාර්ගය)
    - ✓ මහනාගහුල, චන්දනගාම ගල්ඔය, පොළොන්නරුව - නැගෙනහිර දෙසින්

- ක්‍රි.ව. 1070 දී, රජරට චෝළ ආධිපත්‍යය බිඳ දමා ලංකාව එක්සේසත් කොට පොළොන්නරුව අගනුවර බවට පත්කර ගෙන පාලනය ගෙන යාම.

(ලකුණු 16 යි)

5. **පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.**

(i) මහින්දාගමනය
(ii) කාලිංග මාඝ ආක්‍රමණය
(iii) ගම්පොළ යුගයේ කලා හා ගෘහනිර්මාණ ශිල්පය
(iv) භයවන පරාක්‍රමබාහු රජතුමා

(ලකුණු 08 x 2 =16 යි)

(i) මහින්දාගමනය

- දේවානම්පිය තිස්ස රජු හා අශෝක අධිරාජයා අතර පැවති සබඳතාවල ප්‍රතිඵලයක් වශයෙන් මෙරටට මහින්දාගමනය සිදුවීම (පසුබිම විස්තර කොට තිබිය හැකියි).

- මිහින්තලා පර්වතට සිදු වූ මහින්දාගමනය (මිහිඳුහිමි ඇතුළු දූත පිරිස) - ප්‍රථම ධර්ම දේශනාව - ප්‍රථම වරට සිදු වූ පැවිදි කිරීම්.
- රජු ඇතුළු රාජකීයයන් බුදුදහම වැළඳගැනීම - බුදුදහම රාජ්‍ය ආගම බවට පත්වීම.
- මිහිඳු හිමියන් විසින් අනුරාධපුර නගරයේ සීමා ලකුණු කිරීම. මහමෙව්නා උයන සඟ සතු කිරීම.
- පාත්‍රා ධාතුව වැඩම කරවීම හා ථූපාරාමය ඉදිකරවීම.
- වැදගත් ප්‍රතිඵල අතර:
  දේශපාලන වශයෙන් අශෝක අධිරාජයා සමග පැවති සම්බන්ධතා වඩා පුළුල් වීම (විරුදය-අභිෂේකය ආදී); බෞද්ධ සංස්කෘතියකට පදනම වැටීම; දුම්න්දාගමනයට හා භික්ෂුණී ශාසනය පිහිටුවීමට මග හෙළිවීම.

(ලකුණු 08 යි)

(ii) කාලිංග මාඝ ආක්‍රමණය

- 1215 දී නැගෙනහිර ඉන්දියාවේ කාලිංග දේශයෙන් පැමිණි මොහු, ලංකාව ආක්‍රමණය කොට, පරාක්‍රම පාණ්ඩ්‍ය සිහසුනෙන් පහකිරීමෙන් අනතුරුව බලය අල්ලා ගැනීම. 1255 දක්වා බලය අල්ලා ගෙන සිටීම.
- කේරළ සෙබළුන් 24000ක් පමණ රැගෙන පැමිණ කරන ලද මෙම ආක්‍රමණය, ලංකා ඉතිහාසයේ විනාශකාරීම ආක්‍රමණවලින් එකක් වීම.
- රජරට භීෂණකාරී ප්‍රචණ්ඩ පාලනයක් ගෙනයාම:
  බෞද්ධ සිද්ධස්ථාන කොල්ලකා විනාශ කිරීම.
  භික්ෂූන් වහන්සේට වධහිංසා පැමිණවීම - උන්වහන්සේ මායාරට, රුහුණුරට හා මලයරටට සහ චෝළ, පාණ්ඩ්‍ය දේශවලට පලා යාම.
  පොතපත විනාශ කිරීම ඇතුළු විශාල සංස්කෘතික සංහාරයක නිරතවීම.
  ප්‍රභූ ජනයා සතු දේපළ කොල්ලකෑම හා ඔවුන්ට එරෙහිව මර්දනය ක්‍රියාත්මක කිරීම.
  සාමාන්‍ය ජනයා පීඩාවට පත් කිරීම - අත් පා කපා දමමින් දඬුවම් කිරීම, වස්තුව කොල්ලකෑම.
- මෙම ක්‍රියා පිළිවෙත නිසා රජරට ජනශූන්‍ය කලාපයක් බවට ක්‍රමයෙන් පත්වීම හා වාරිමාර්ග පද්ධතිය බිඳවැටීම.
- අවසන් ප්‍රතිඵලය වශයෙන් රජරට ශිෂ්ටාචාරය බිඳවැටීම.
- රාජධානි නිරිතට සංක්‍රමණය වීමට මග පෑදීම.

(ලකුණු 08 යි)

(iii) ගම්පොළ යුගයේ කලා හා ගෘහනිර්මාණ ශිල්පය

<u>කලාව</u>

- ලෝකඩ ප්‍රතිමා:
  ලංකාතිලක විහාරය - IV දෙවන බුවනෙකබාහු රජුගේ රුවයැයි සැලකෙන ප්‍රතිමාව
  දඹුලු විහාරයේ රජ ලෙන - වළගම්බා සහ නිශ්ශංකමල්ල රජවරුන්ගේ රුවයැයි සැලකෙන ප්‍රතිමා; නාථ, උපුල්වන් හා විෂ්ණු දේව ප්‍රතිමා
- ඇම්බැක්ක දේවාලයේ කැටයම්වලට සුවිශේෂී ස්ථානයක් හිමිවීම:
  ලී කණුවල කැටයම් අන්තර්ගතව තිබීම

(හංස පූට්ටුව, වෘෂභ කුංජරය, ගජසිංහ, හේරුණ්ඩ පක්ෂියා, මල්ලව පොරය, ඇත් පොරය, ඇත්කඳ ලිහිණියා, නළඟන රූප)

- අළුදෙණිය විහාරයේ අලුත් දේවාලය - ලී උළුවහුවල කැටයම්

- ගඩලාදෙණිය - විහාර ගෙයි ශිඛරයේ ඇති ස්තූපිකාව තුළ සිතුවම් ඇඳ තිබීම (විනාශවී ගොස් ඇත /ඉතිරිව ඇති කොටසින් වෙස්සන්තර රජු ඇලි ඇතා දන්දීම නිරූපිතය); පාදමේ පෙරහැර නිරූපිත සිතුවම්

- අලවතුර, වතුර හා මාකුර විහාරවලද මේ යුගයට අයත් නිර්මාණ දක්නට ලැබීම.

ගෘහනිර්මාණ ශිල්පය

- ගඩලාදෙණිය හා ලංකාතිලක විහාර දෙක වැදගත් වීම.

- ගඩලාදෙණි විහාරය:
  - ✓ ගඩලාදෙණි සෙල්ලිපියේ මෙම ඉදිකිරීම පිළිබඳ තොරතුරු දක්වා තිබීම
  - ✓ දකුණු ඉන්දියාවේ ආන්ද්‍ර ගෘහනිර්මාණ ශෛලියේ ආභාසය
  - ✓ ගල්තලාවක් මත කළුගලින් කරවා තිබීම
  - ✓ වහල ගඩොලින් කරවා තිබීම
  - ✓ ගණේශ්වරාචාර්ය ඇතුළු ශිල්පීන් විසින් ඉදිකොට තිබීම

- ලංකාතිලක විහාරය:
  - ✓ ආන්ද්‍ර වාස්තු විද්‍යාවේ ආභාසය දැකිය හැකි වීම
  - ✓ දකුණු ඉන්දියානු ආභාසය දක්නට ලැබීම වහල වෙනුවට ශිඛර යොදා නිමැවීම හෙවත් 'ගෙඩිගේ' ශෛලිය අනුගමනය කිරීම

(ලකුණු 08 යි)

(iv) භයවන පරාක්‍රමබාහු රජතුමා

- පළමුවන පරාක්‍රමබාහු රජුගෙන් පසුව දිවයින එක්සේසත් කිරීමටත් එය පවත්වා ගෙන යාමටත් සමත් වූ පාලකයා යැයි සැලකීම. මේ රජුගේ දේශපාලන කාර්ය සංසිද්ධිය පිළිබඳව **අලකේශ්වර යුද්ධය, රාජාවලිය හා සංදේශ කාව්‍ය** වැනි මූලාශ්‍ර රැසක් මඟින් තොරතුරු අනාවරණය වීම.

- 1412 දී රයිගම බලයට පත්වීම හා 1415 දී ජයවර්ධනපුර කෝට්ටේ සිය අගනගරය බවට පත්කර ගැනීම. කෝට්ටේ රාජධානිය කරගත් පළමුවන පාලකයා වීම.

- දේශපාලනය:
  - ✓ වීදාගම මාහිමියන් වැනි භික්ෂූන් වහන්සේගේ අනුග්‍රහය යටතේ බලය ස්ථාවර කරගැනීම.
  - ✓ උඩරට ප්‍රදේශවල අවනතභාවය තහවුරු කරගැනීම.
  - ✓ වන්නි පාලකයන් අවනත කරගැනීම.
  - ✓ තම පුත් තනතුරේ හදාවඩා ගත් සපුමල් කුමාරයා සේනාපති තනතුරට පත්කොට, එවකට ඉතා බලවත්ව සිටි යාපනේ ආර්යචක්‍රවර්තීන් 1449 දී පරාජය කොට රට එක්සේසත් කිරීම.
  - ✓ උඩරට ප්‍රදේශවල කැරලි ගැසූ ජෝතිය සිටාණන්ගේ කැරලි අම්බුලුගල කුමාරයා යොදවා මැඩ එම ප්‍රදේශවල ආධිපත්‍යය තහවුරු කර ගැනීම.
  - ✓ දකුණු ඉන්දියාවේ විජයනගර් අධිරාජයා සමග කළ සටන හා අධිවීරරාම් පටුන ආක්‍රමණය කිරීම.

විදේශ සබඳතා:

✓ ඉන්දියාවේ විජයනගර් අධිරාජයා විසින් එල්ල කරන ලද ආක්‍රමණය ජය ගැනීම.
✓ 1440 ගණන්වල වෙළෙඳාමට සම්බන්ධ ගැටලුවක් මුල් කොට ගෙන දකුණු ඉන්දියාවේ අනිවිරරාම පට්ටනය (අදිවීරරාම පටුන) හෙවත් ආද්‍රායම් පෙට් ආක්‍රමණය කිරීම.
(චීන සම්බන්ධතා පිළිබඳවද සඳහනක් කර තිබිය හැකියි.)

▪ සංස්කෘතිය:

✓ රාජ්‍ය අනුග්‍රහය අධ්‍යාපනයේ වර්ධනයට පිටුබලයක් වීම.
✓ පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන තම මව සිහිවීම පිණිස රජතුමා විසින් කරවන ලදී.
✓ වීදාගම ශ්‍රී ඝනානන්ද, තොටගමුවේ විජයබා, දෙවුන්දර ඉරුගල්කුලතිලක, කෑරගල පද්මාවති, පැපිලියානේ සුනේත්‍රාදේවී සහ එරබත්ගොඩ ධර්මරාජ වැනි පිරිවෙත් ප්‍රකට ශාස්ත්‍රායතන වීම.
- වීදාගම මෛත්‍රීය හිමි, කෑරගල වනරතන හිමි, තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
- සිංහල, පාලි, සංස්කෘත, ප්‍රාකෘත හා දෙමළ වැනි භාෂාවන්ද කාව්‍ය, නාටක, ජ්‍යොතිර්විද්‍යා, ගණිතය, චතුර්වේදය, වෛද්‍ය ශාස්ත්‍රය වැනි විවිධ විෂයයන් ඉගැන්වීම.
- ගිහි පැවිදි පඬිවරුන් - මහා කාව්‍ය, බුදුගුණ කාව්‍ය, සන්දේශ කාව්‍ය, උපදේශ ග්‍රන්ථ හා ප්‍රශස්ති ආදිය රචනය
- ජාත්‍යන්තර කීර්තියට පත්ව තිබීම නිසා විදේශවලින් ගිහි පැවිදි සිසුන් පැමිණීම. නිදසුන්: ශ්‍රී රාමවන්ද්‍ර කවිභාරතී පඬිවරයා ශ්‍රී රාහුල මාහිමියන්ගෙන් අධ්‍යාපනය ලැබීමට තොටගමු විජයබා පිරිවෙනට පැමිණීම.

✓ බුදුදහමට හා සෙසු ආගම්වලට අනුග්‍රහ දැක්වීම:
- තුන්මහල් දළදා මැදුරක් ඉදිකරවීම.
- රත්නපුර මහසමන් දේවාලය ප්‍රතිසංස්කරණය කරවීම (මහ සමන් දේවාල සන්නස)
- හින්දු ආගමික ස්ථානයක් වූ මුන්නේශ්වරම් දේවාලය ප්‍රතිසංස්කරණය.
- බ්‍රාහ්මණයන්ට අනුග්‍රහ දැක්වීම (ඔරුවල තඹ සන්නස, නායිමන දෙමළ පුවරු ලිපිය, ගිරා සන්දේශය)
- කෝට්ටේ පත්තිනි දේවාලයක් ඉදිකරවීම.

මෙකල දේශපාලන, ආර්ථික, ආගමික හා සංස්කෘතික යන සෑම අංශයකම පාහේ ප්‍රබෝධයක් ඇතිවීම.

(ලකුණු 08 යි)

C කොටස

6. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ සමාලෝචනය කරන්න.

(i) පරිපාලන හා අධිකරණ

(ii) ආර්ථික

▪ ලන්දේසීන්ගේ ප්‍රධාන අරමුණ වූයේ ලංකාවෙන් කුළුබඩු - විශේෂයෙන් කුරුඳු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීමයි. ලන්දේසි යටත්විජිත කටයුතු ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් මෙහෙයවන ලදී. 1658 සිට 1796 දක්වා මෙරට මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගමෙන් (VOC) පාලනය වීම.

- ලන්දේසීන්ගේ අරමුණු අතර වෙළඳ (ආර්ථික) අරමුණු වඩාත් බලවත්වූ බව කිව හැකිය.

- **පරිපාලන හා අධිකරණ**

<u>පරිපාලන</u>

- ✓ ලන්දේසීන් දේශීය පාලන ව්‍යුහය හා යාන්ත්‍රණය එලෙසින්ම ක්‍රියාත්මක කිරීම.
- ✓ ලන්දේසි පාලන ප්‍රදේශය කොමාන්ඩරිවලට (දිසාවනි) බෙදා තිබීම (කොළඹ, ගාල්ල, යාපනය) - කොළඹ ආණ්ඩුකාරයා යටතේද අනෙක් ඒවා කොමදෝරුවරුන් යටතේද පාලනය වීම.
- ✓ කොමාන්ඩරි තුළද කලින් පැවති දේශීය පාලන ව්‍යුහය හා පාලන නිලතල ක්‍රියාත්මක කිරීම.
- ✓ ඉහළ නිලතලවලට ලන්දේසි ජාතිකයන් පත් කිරීම.
- ✓ දේශීය බද්ද සංවිධානය, රාජකාරි ක්‍රමය හා ඉඩම් භුක්ති ක්‍රමය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කිරීම.

- ✓ පරිපාලන සංවිධානය වාණිජ අරමුණු පහසු කරවන්නක් වීම.
- ✓ තෝම්බු පවත්වා ගෙන යාම.

<u>අධිකරණ</u>

- ✓ දේශීය ක්‍රමය පවත්වා ගෙන යන අතරේ නව උසාවි පද්ධතියක් ඇති කිරීම.
- ✓ උසාවි වර්ග:
  රාද් වැන් ජස්ටිටී - මහාධිකරණය (කොළඹ, ගාල්ල හා යාපනය)
  සිවිල් රාද් - සිවිල් උසාවිය
  ලැන්ද් රාද් - ඉඩම් උසාවිය
- ✓ බතාවියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලයට ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ යටත්වීම.
- ✓ පොදුවේ රෝම-ලන්දේසි නීතිය ක්‍රියාත්මක කිරීම. එහෙත් යාපනයේ හින්දු ජනතාවගේ දේපළ සම්බන්ධව තේසවලාමේ නීතිය ක්‍රියාත්මක කිරීම.

- **<u>ආර්ථික ප්‍රතිපත්තිය</u>**

- ✓ වෙළඳ සමාගම විසින් ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවීම. මෙරට ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් විය.
- ✓

  1) යුරෝපය තුළ ඒ වන විට වෙළඳ වටිනාකමක් පැවති ද්‍රව්‍ය මෙරටින් ලබාගැනීම. (කුරුඳු, ගම්මිරිස් ඇතුළු අනෙකුත් කුළුබඩු)

  2) ශ්‍රී ලංකාවේ වරායන් ආශ්‍රිතව මෙතෙක් කල් වෙළඳ කටයුතුවල නියැලුණු ආසියානු වෙළඳුන්ගේ (චීන, අරාබි, මලබාර්) කටයුතු තමන් අතට ගෙන වෙළඳ ඒකාධිකාරයක් ගොඩනැගීම.

- ✓ පාරම්පරිකව පැවති ඉඩම් භුක්ති ක්‍රමය, රාජකාරිය, බදු, බද්ද සංවිධානය හා කුල ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම.
- ✓ දේශීය බදු ක්‍රමය උපයෝගී කරගැනීම.
  මරාල බද්ද හා පොල් බද්ද (පොල් අය) තමන්ගේ අවශ්‍යතා ආදායම් මාර්ග ලෙස උපයෝගී කරගැනීම.

- ✓ ඇතැම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළඳ ඒකාධිකාරයක් පවත්වාගෙන යාම (කුරුඳු, අලි ඇතුන් වෙළඳාම, මැණික් ගැරීම හා විකිණීම, මුතු කිමිදීම).
- ✓ ප්‍රධාන ආදායම් උපයන භාණ්ඩ ලෙස ඇතැම් බෝග හඳුනා ගෙන ඒවා වෙළඳාම් කිරීම (පුවක්).
- ✓ එසේ නමුත් ඔවුන්ටම ආවේණික ලක්ෂණ සහිත ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක කිරීම
  - ලංකාවේ ඉඩම් පිළිබඳ තොරතුරු අඩංගු තෝම්බු සකස් කිරීම මගින් ලන්දේසීන් ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම.
  - ප්‍රධාන වෙළඳ ද්‍රව්‍යය ලෙස කුරුඳු ඇලකන ලද නමුත් ලන්දේසීන් සිය අයවැය පරතරය පියවා ගැනීම සඳහා පුවක් වෙළඳාමෙන් ලද ආදායම් යොදා ගැනීම.
  - කුරුඳු, කෝපි වගා කරවීම.
- ✓ අන්තර්-ආසියාතික වෙළඳාමට සම්බන්ධ වීම.
- ✓ ඇළ මාර්ග ඉදිකරවීම (ප්‍රවාහනය).
- ✓ ඇතැම් වාරිමාර්ග ප්‍රතිසංස්කරණය කරවීම හා ආණ්ඩුවේ වියදම් අඩුකර ගැනීමේ අරමුණින් සහල් නිෂ්පාදනය පවත්වා ගෙන යෑම.
  - කිරම, උඟරුබොක්ක වැනි ප්‍රදේශවල වැව් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම හා මුතුරාජවෙල අස්වැද්දීම.
- ✓ කපු වැවීම සහ රෙදි සායම්කරණය සඳහා භාවිතා කළ ඉන්ඩිගෝ වැවීම.
- ✓ ඇතැම් ප්‍රදේශවල කුරුඳු වගා කිරීමට පියවර ගැනීම (කදිරාන, ඇවරිවත්ත, කුරුඳුවත්ත).
- ✓ උඩරට රාජධානිය සමග අභ්‍යන්තර වෙළඳාමක් පවත්වාගෙන යාම හා රට තුළ වෙළඳාමේ ඒකාධිකාරයක් ගොඩනගා ගැනීම.
  - ලුණු, කරවල වැනි දෑ උඩරටටත්, එම ප්‍රදේශයෙන් පුවක්, ගම්මිරිස්, බුලත්, කරාබු නැට්, කරඳමුංගු, මී ඉටි, මී පැණි ඇතුළු ද්‍රව්‍ය සමූහයක් වෙරළබඩ ප්‍රදේශවලටත් තවලම් මගින් ප්‍රවාහනය කිරීම.

(ලකුණු 16 යි)

7. "1848 ජනතා නැගීසිටීම ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඇති වූ ඉතා ප්‍රබල අරගලයකි."

(i) 1848 අරගලය ඇතිවන විට ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න.

වෛකවුන්ට් ටොරිංටන් (ටොරිංටන් සාමි)

(ලකුණු 01 යි)

(ii) එවකට සිටි විජිත ලේකම්වරයා නම් කරන්න.

ජේම්ස් එමර්සන් ටෙනන්ට්

(ලකුණු 01 යි)

(iii) 1848 අරගලය ඇතිවීමට තුඩු දුන් හේතු පරීක්ෂා කරන්න.

- දිගුකාලීන සාධක:
  - ✓ කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණවල බලපෑම:
    - උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ කිරීම හේතු කොට ගෙන උඩරට සාම්ප්‍රදායික අනන්‍යතාවට හානි සිදුවීම.
    - සිවිල් සේවකයන්ට වතු වගාවේ නිරතවීමට අවසර දීම හේතු කොට ගෙන පරිපාලනය දුර්වල වීම.

- රාජකාරී ක්‍රමය අහෝසි කිරීම නිසා සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමයේ හටගත් වෙනස්වීම.
- ගම්සභා ක්‍රමය අකර්මණ්‍ය වීම නිසා ගැමි ජනතාවගේ ප්‍රශ්න උග්‍ර වීම.
- නව අධිකරණ ක්‍රමය වියදම් අධික හා සංකීර්ණ එකක් වීම නිසා ගැමියන් මුහුණදුන් ගැටලු.
- දේශීය කෘෂිකර්මාන්තය කෙරෙහි බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ අවධානය අඩු වීම.

✓ වතු වගාවේ බලපෑම:

- වතු වගාවේ දියුණුව කෙරෙහි බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ විශේෂ උනන්දුව යොමුවීම.
- යුරෝපා වැවිලිකරුවන්, පහතරට ව්‍යාපාරිකයන්, දකුණු ඉන්දීය කම්කරුවන් ආදීන් උඩරටට සංක්‍රමණය වීම, උඩරට සාම්ප්‍රදායික ජනජීවිතයට අහිතකර බලපෑම් ඇති කිරීම.
- 1840 අංක 12 දරන ඉඩම් අත්පත් කරගැනීමේ ආඥාපනත (Prevention of Encroachments upon Crown Lands Ordinance) ක්‍රියාත්මක කිරීම නිසා ගොවීන්ට පාරම්පරික ගොවිබිම් අහිමිවීම.
- වතු වගාව සඳහා වනාන්තර එළිකිරීම, දේශීය කෘෂිකර්මාන්තය හා ජන ජීවිතය කෙරෙහි අහිතකර ලෙස බලපෑම.
- උඩරට සුරාසැල් විවෘත කිරීම හේතු කොට ගෙන සමාජ දුරාචාර වේගයෙන් පැතිරයාම.

■ ආඥන්න සාධක:

✓ ස්වකීය ආදායම වැඩිකර ගැනීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව නව බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.

- ටොරිංටන් ආණ්ඩුකාරයා විසින් නව බදු හඳුන්වා දීම.
- කඩ සාප්පු බද්ද, ඉස්තෝප්පු බද්ද, කරත්ත බද්ද, ඔරු බද්ද, තොටුපල බද්ද, තුවක්කු බද්ද, ඇඟ බද්ද, මුද්දර බද්ද, සුනඛ බද්ද.

✓ රජය හා ආගම අතර පැවති සාම්ප්‍රදායික සමීප සම්බන්ධතාව යටත්විජිත ආණ්ඩුව විසින් නොසලකා හරිනු ලැබීම.

- බ්‍රිතාන්‍ය ආණ්ඩුව මෙතෙක් අනුගමනය කළ ප්‍රතිපත්තියෙන් ඉවත්වී දළදා වහන්සේගේ ආරක්ෂාව හිඤ්ඤන් වහන්සේ හා දියවඩන නිළමේ වෙත පැවරීම.

✓ උඩරට ඉඩම් පිළිබඳව නිල්පොතට කරුණු ඇතුළත් කිරීමට කරන ලද සංගණනය හේතු කොට ගෙන උඩරටියන් තුළ අවිශ්වාසයක් ඇතිවීම.

(ලකුණු 10 යි)

(iv) 1848 අරගලයෙන් උද්ගත වූ ප්‍රතිඵල සැකෙවින් සාකච්ඡා කරන්න.

1848 ඇති වූ සටන බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව එල්ල වූ අවසාන සන්නද්ධ අරගලය ලෙස හැඳින්විය හැකිය. මෙම සටන ප්‍රධාන වශයෙන් මාතලේ හා කුරුණෑගල යන ප්‍රදේශවලත්, සුළු වශයෙන් කොළඹත් ඇතිවිය. මෙම සටන හා එය මර්දනය කළ ආකාරය හේතු කොට ගෙන හටගත් ප්‍රතිඵල ගණනාවකි:

✓ යුධ නීතිය හා මර්දනය නිසා සිදු වූ ජීවිත අහිමිවීම.
✓ නායකත්වයට මරණ දඬුවම (කඩහපොළ හිමි, පුරන් අප්පු, ඩිංගිරාළ); ගොංගාලේගොඩ බණ්ඩා පිටුවහල් කිරීම.
✓ සිද්ධිය පිළිබඳ කරුණු සෙවීමට බෙලි කොමිසම පත් කිරීම.
✓ ටොරිංටන් හා විජිත ලේකම් එමර්සන් ටෙනන්ට් නැවත මව් රටට කැඳවීම.
✓ පීඩාකාරී බදු ගණනාවක් අහෝසි කිරීම.

✓ මින් පසුව පත් වූ ඇතැම් ආණ්ඩුකාරවරුන් දේශීය යැපුම් කෘෂිකර්මාන්තයෙහිලා වැදගත්වන වාරි කර්මාන්ත ප්‍රතිසංස්කරණයට උනන්දු වීම.

✓ මර්දනය හා ඉන් පසු ගන්නා ලද පියවර හේතුකොට ගෙන මෙරට ජාතික 'සන්නද්ධ සටන්' ව්‍යාපාරයක් යළි මතු නොවීම. (ලකුණු 04 යි)

8. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න.

- 1947 සෝල්බරි කොමිසමේ නිර්දේශ පරිදි මෙම ආණ්ඩු ක්‍රමය සකස් වීම.
- කිරීටය, ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය යන ආයතනවලින් සමන්විත පාර්ලිමේන්තු කැබිනට් ක්‍රමයකින් යුත් ආණ්ඩුක්‍රමයක් වීම.
- කිරීටයේ නියෝජිතයා ආණ්ඩුකාරයා වීම. ව්‍යවස්ථාදායකය, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව යනුවෙන් ද්වි මණ්ඩල සංයුතියකින් යුතු විය.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලය - මන්ත්‍රීන් 101 දෙනෙකි. මහජන ඡන්දයෙන් තෝරාගත් 95 / අග්‍රාණ්ඩුකාරයා විසින් අගමැතිගේ උපදෙස් පරිදි නාමකරණයෙන් පත් කරන ලද 06.
- නීති සම්පාදනය හා මුදල් කටයුතු පාලන බලය පාර්ලිමේන්තුව සතුවීම.

  එහෙත් නීති පැනවීමේදී සීමා පැවතීම. විශේෂයෙන්ම සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන තිබූ විධිවිධාන මෙම ආණ්ඩුක්‍රමයේ විශේෂත්වයක් වූ අතර එමගින් ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය සීමාවීම.

- රාජ්‍ය සේවා කොමිසම සහ අධිකරණ සේවා කොමිසම පිහිටුවීම.
- 1972 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන්නේ තෙක් මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීම.
- අග්‍රාණ්ඩුකාරයා:

  1948 දී ලංකාව ලද නිදහස සම්පූර්ණ එකක් නොව ඩොමීනියන් තත්ත්වයක් වීම. ඒ හේතු කොට ගෙන බ්‍රිතාන්‍ය රජයේ නියෝජිතයා වශයෙන් අග්‍රාණ්ඩුකාර තනතුර පැවතීම.

  ✓ අගමැතිගේ උපදෙස් මත බ්‍රිතාන්‍ය කිරීටය විසින් අග්‍රාණ්ඩුකාරයා පත් කරනු ලැබීම.

  ✓ නාමික විධායකය වුවද ස්වාභිමතය මත ක්‍රියාත්මක කළ හැකි වූ බලතල කීපයක් හිමිවීම: මැතිවරණයකින් පසුව හෝ පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක හෝ අගමැතිවරයෙකු පත් කිරීම ඒ අතර කැපී පෙනීම.

  ✓ අගමැතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියාත්මක කළ හැකි බලතල ගණනාවක් හිමිවීම: පාර්ලිමේන්තුවේ උභය මණ්ඩලවලින් සම්මත කරන ලද පනත්වලට අනුමැතිය ලබාදීම; කැබිනට් ඇමතිවරුන් පත්කිරීම; විදේශ තානාපතිවරුන් පත්කිරීම; පාර්ලිමේන්තුව කැඳවීම, කල්තැබීම හා විසුරුවා හැරීම; සෙනෙට් මණ්ඩලයට, රාජ්‍ය සේවා කොමිසමට සහ අධිකරණ සේවා කොමිසමට සාමාජිකයන් පත්කිරීම යනාදිය ඒ අතර ප්‍රධාන වේ.

- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය:

  ✓ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මැතිවරණයෙන් වැඩිම ආසන සංඛ්‍යාවක් දිනාගත් පක්ෂයේ නායකයා අගමැති තනතුරට පත්කිරීම.

- ✓ අගමැතිවරයා විසින් තම පක්ෂයේ මන්ත්‍රීවරුන් අතුරින් ඇමති මණ්ඩලය තෝරාගනු ලැබීම.
- ✓ රාජ්‍ය ආරක්ෂක ඇමති ධුරය අනිවාර්යයෙන්ම අගමැතිවරයා දැරිය යුතු වීම.
- ✓ කැබිනට් මණ්ඩලය මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට වගකිව යුතු වීම හා සාමූහික වගකීමෙන් බැඳී සිටීම.

▪ ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකය:

- ✓ ව්‍යවස්ථාදායකය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාව වශයෙන් මණ්ඩල දෙකකින් සමන්විත වීම.
- ✓ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජිතයන් ඡන්ද කොට්ඨාශ පදනම් කොට ගෙන සර්වජන ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම.
- ✓ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය මන්ත්‍රීවරුන් 101 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් 95 දෙනෙක් ඡන්දයෙන් හා අනෙක් 6 දෙනා අග්‍රාණ්ඩුකාරයා විසින් නාමකරණයෙන් පත් කරනු ලැබීම.
- ✓ රටේ නීති සම්පාදනයේදී වඩාත් විචක්ෂණශීලී තීන්දු ගැනීමේ අරමුණ ඇතිව විවිධ ක්ෂේත්‍රවල විශිෂ්ඨ සේවාවක් ඉටුකරන ලද විද්වතුන් සෙනෙට් සභාවට පත් කිරීම.
- ✓ සෙනෙට් මණ්ඩලයේ සාමාජිකත්වය 30 කි: ඒ අතරින් 15 දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් අතරින් තෝරාගනු ලැබීම; ඉතිරි 15 දෙනා අගමැතිවරයාගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත්කරනු ලැබීම.
- ✓ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සම්මත වූ සාමාන්‍ය පනත් නීතිගත වීමට සෙනෙට් මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය වීම. මුදල් පනත් සෙනෙට් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වුවත් ඒවා සම්බන්ධයෙන් සෙනෙට් මණ්ඩලයට විශේෂ බලයක් නොමැති වීම.
- ✓ අධිකරණ අමාත්‍ය තනතුර අනිවාර්යයෙන්ම සෙනෙට් මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් දැරිය යුතුවීම.

(ලකුණු 16 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඔනෑම <u>දෙකක</u> ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) පළමුවන විමලධර්මසූරිය රජු
(ii) රොබට් ක්‍රවුන්රිග්
(iii) පොන්නම්බලම් අරුණාචලම්
(iv) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ

(ලකුණු 08 x 02 = 16)

(i) පළමුවන විමලධර්මසූරිය රජු (1592 - 1604)

- පේරාදෙණියේ ප්‍රභූවරයෙකුව සිටි වීරසුන්දර බණ්ඩාරගේ පුත්‍රයා වූ කොනප්පු බණ්ඩාර, පියා ඝාතනයට ලක්වීමත් සමඟ පලා ගොස් පෘතුගීසීන් ඇසුරේ ජීවත්වීම.
- අවුස්ත්‍රියාවේ දොන් ජුවන් ලෙස ප්‍රකට වූ ඔහු, යමසිංහ බණ්ඩාර ඝාතනය කොට 1592දී උඩරට කිරුළ අත්පත් කර ගැනීම.

- කුසුමාසන දේවිය විවාහ කර ගෙන ස්වකීය රාජත්වය තහවුරු කර ගැනීම.
- උඩරට පෘතුගීසි විරෝධී ප්‍රතිපත්තිය - දන්තුරේ හා බලන සටන් ජයගැනීම.
- සීතාවක රාජසිංහ රජුගේ උඩරට ආක්‍රමණය පරාජය කොට ප්‍රදේශ කීපයක් ඈඳා ගැනීම.
- ලන්දේසී ආධාර ලබාගෙන පෘතුගීසීන් පලවා හැරීම සඳහා ගත් උත්සාහය අසාර්ථක වීම.
- ආගමික සේවය:
  - දෙල්ගමු විහාරයේ තැන්පත් කර තිබූ දළදාව මහනුවරට වැඩමවා දළදා මැදුරක් ඉදිකරවීම.
  - බුරුමයෙන් භික්ෂූන් වඩමවා උපසම්පදා කර්මය නැවත ආරම්භ කරවීම.
  - විහාරස්ථාන ප්‍රතිසංස්කරණය - ලංකාතිලකය, ගඩලාදෙණිය, රිදී විහාරය
  - බදුල්ලේ කතරගම දේවාලය ඉදිකරවීම
- ආර්ථික දායකත්වය:
  වී වගාව ප්‍රමුඛ කෘෂිකර්මාන්තයට අනුග්‍රහ දැක්වීම; කපු වගාව ව්‍යාප්ත වීම.
- මීට අමතරව යුධ හා ගොවි උපකරණ තැනීම උදෙසා ලෝහ (යකඩ හා වානේ) කර්මාන්තය වර්ධනය කිරීම මෙන්ම වෙඩි ලුණු කර්මාන්තය පවත්වාගෙන යාම.

(ලකුණු 08 යි)

(1812—1822)

(ii) රොබට් බ්‍රවුන්රිග්

- 1758 අයර්ලන්තයේ වික්ලොව් ප්‍රාන්තයේ උපත ලැබීම.
- 17වන වියේදී බලලත් කණිෂ්ඨ නිලධාරියෙකු වශයෙන් යුධ හමුදාවට බැඳී පසුව යෝක්හි ආදිපාදවරයාගේ (පසුව තෙවන ජෝර්ජ් රජුගේ) හමුදා ලේකම් තනතුර දක්වා උසස්වීම.
- 1812 - මේට්ලන්ඩ්ට පසු මෙරට මුහුදුබඩ පළාත්වල බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වශයෙන් පත්වීම.
- 1815 උඩරට අත්පත් කරගැනීම හා උඩරට ගිවිසුමට අත්සන් තැබූ ආණ්ඩුකාරවරයා වීම.
- 1817/1818 නිදහස් අරගලය දරුණු ලෙස මර්දනය කිරීම.
- 1819දී මව්රට බලා යාම සහ නැවත 1822 දක්වා ආණ්ඩුකාර ධුරය දරනු පිණිස ලංකාවට පැමිණීම.

(ලකුණු 08 යි)

(iii) පොන්නම්බලම් අරුණාචලම්

- 1853දී උපන් (පියා - වාසලමුදලි අරුණාචලම් පොන්නම්බලම්) මොහු ~~19වැනි සියවසේ මුල් දශක තුන ඇතුළත දේශපාලන ක්ෂේත්‍රයේ කැපී පෙනුණු~~ තවත් දෙමළ නායකයෙකු වූ පොන්නම්බලම් රාමනාදන්ගේ සහෝදරයෙකු විය.
- එකල කොළඹ ඇකඩමිය ලෙස හැඳින්වෙන වර්තමානයේ රාජකීය විද්‍යාලයෙන් සහ ලන්ඩනයේ ක්‍රයිස්ට් විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ මොහු බ්‍රිතාන්‍ය පාලනය යටතේ දේශීය පුද්ගලයන්ට ප්‍රවේශවීමට අසීරු වූ සිවිල් සේවයට 1875 දී ඇතුළුවීම.
- රටේ විවිධ ප්‍රදේශවල විවිධ තනතුරු දැරූ අරුණාචලම්, රෙජිස්ට්‍රාර් ජෙනරාල් තනතුරට සහ බස්නාහිර පළාතේ පිස්කල් තනතුරට පත්වීමත් සමඟ මෙරට ජන සංඛ්‍යා ලේඛන ක්ෂේත්‍රයේ ඓතිහාසික වශයෙන් වැදගත් සේවාවක් ඉටුකිරීම - 1911 ජන සංඛ්‍යා ලේඛන වාර්තාව සකස් කිරීම (මෙය සමකාලීන ඉතිහාසය විග්‍රහ කරන මූලාශ්‍රයක් වීම).
- 1913 සිවිල් සේවයෙන් විශ්‍රාම ගිය ඔහු සෘජුවම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ උදෙසා වූ උද්ඝෝෂණවලට සම්බන්ධ වීම.
- 1915 සිංහල මුස්ලිම් කෝලාහලයේදී බ්‍රිතාන්‍ය පාලකයන් සිංහලයන්ට සිදු කළ අසාධාරණයට එරෙහිව නැඟී සිටීම - ආණ්ඩුකාරයාට පමණක් නොව බ්‍රිතාන්‍ය දේශපාලන නායකයන්ට කරුණු ඉදිරිපත් කිරීම.
- 1917 "අපේ දේශපාලන අවශ්‍යතා" මැයෙන් විශේෂ දේශනයක් කරමින් සියලු ජන කොටස් එකමුතුවී බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව නැඟී සිටිය යුතු බව පෙන්වා දීම, එම වසරේදීම ලංකා ප්‍රතිසංස්කරණ සංගමය පිහිටුවීමට පුරෝගාමී වීම.
- 1919 ලංකා ජාතික සංගමය පිහිටුවීමට පුරෝගාමිවීම සහ එහි ප්‍රථම සභාපති තනතුරට පත්වීම.
- ජාතික සංගමය තුළ ඇති වූ විවිධ මතභේද හේතු කොට 1921 ලංකා ජාතික සංගමයෙන් ඉවත්වී 'දුව්ඩ සංගමය' පිහිටුවීමට පුරෝගාමී වීම.
- මෙරටට විශ්වවිද්‍යාලයක අවශ්‍යතාව පෙන්වා දුන් සංවිධානයේ ප්‍රබලයෙකු වීම.
- මේ රටේ ජනතාවට ප්‍රෞඪ ඉතිහාසයක් ඇති බව සනාථ කෙරෙන පරිදි "ලංකා ඉතිහාසයේ කටු සටහන්" නැමති ඔහුගේ කෘතිය ලියා තිබීම.

(ලකුණු 08 යි)

(iv) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ

1972 ජනරජ ව්‍යවස්ථාව සකස් කරන ලද්දේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරමිනි. එහෙයින් මෙය දේශීය නිර්මාණයකි. මෙම ව්‍යවස්ථාව 1972 සිට 1977 දක්වා ක්‍රියාත්මක විය. මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද එකම මැතිවරණය 1977දී පැවැත්විණ. මන්ත්‍රීවරු 168 දෙනෙකු තෝරා ගනු ලැබිණ.

- මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමඟ එතෙක් පැවති සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි විය.
- ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය: මෙය ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්වීම; ජනතා ස්වාධිපත්‍යය සහතික කරමින් එය ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වීම.
- නාමික විධායකය - අගමැති විසින් පත් කරන ලද ජනාධිපති.

(27) WWW.PastPapers.WiKi (26)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

- මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයකින් යුක්ත වීම. ජාතික භාෂාව, ජාතික ආගම, ජාතික ගීය, ජාතික කොඩිය ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබීම.
- බුද්ධාගමට ප්‍රමුඛස්ථානයක් ලබා දෙන අතර සෙසු ආගම් ඇදහීමේ නිදහස පිළිගෙන තිබීම.
- 1948 සිට ක්‍රියාත්මක වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධිකරණ සේවා කොමිෂන් සභාව අවලංගු කොට එම බලතල කැබිනට් මණ්ඩලයට පැවරීම.
- 1948 සිට බලපැවැත් වූ එංගලන්තයේ ප්‍රිවි කවුන්සිලයට අභියාචනා කිරීමට තිබූ බලය අවලංගු කිරීම.
- මෙරට ස්වෛරීභාවය තහවුරු කරන ලද ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමය වශයෙන් පිළිගැනීම.
- මෙතෙක් බ්‍රිතාන්‍ය කිරීටය සමඟ පැවති සම්බන්ධතා මේ සමඟ අවසන් විය.
  - ✓ බ්‍රිතාන්‍ය රැජිණ තවදුරටත් මෙරට නායිකාව නොවීය. එහෙයින් අග්‍රාණ්ඩුකාර තනතුර අහෝසි විය.
  - ✓ ප්‍රිවි කවුන්සිලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කෙරිණ.
  - ✓ ශ්‍රී ලංකාව සෛවරී ජනරජයක් විය. ඒ සමඟ රටේ නාමයද ශ්‍රී ලංකාව යනුවෙනු වෙනස් විය.

(ලකුණු 08 යි)

******

PAST PAPERS WIKI

(27) WWW.PastPapers.WiKi (27)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!